# විදාතා බිම්මල් බීජ විද්‍යාගාරය

කෑගල්ල දිස්ත්‍රික්කය තුල සිටින බිම්මල් ගොවීන්ගේ ගැටළුවක්ව පැවති උසස් මට්ටමේ බිම්මල් බීජ නොමැති වීම නිසා ඔවුන්ගේ ආදායම් මට්ටම ඉතා පහල මට්ටමක පැවතුන අතර සමහර ව්‍යාපාර අතරමග නතර කරන්නට සිදු වී තිබුණි. මේ ප්‍රශ්නයට විසඳුමක් ලෙස මාවනැල්ල විදාතා මධ්‍යස්ථානය තුල බිම්මල් බීජ විද්‍යාගාරයක් ස්ථාපිත කර එම බීජ විද්‍යාගාරය තුල අස්වැන්න වැඩි බිම්මල් ප්‍රබේද පිලිබඳ පරීක්ෂණ පවත්වා එවැනි පාරිශුද්ධ රෝපිත බීජ විද් යාගාරය තුල රෝපණය කර ඉතා උසස් මට්ටමේ මව්බීජ නිපදවා ඒ තුලින් පලවන පරම්පරාවේ බිම්මල් බීජ ලබාදීම තුලින් කෑගල්ල දිස්ත්‍රික්කය තුල බිම්මල් වගාකරුවන්ට ඉතා උසස් අදායම් තත්වයක් ලැබෙමින් පවතින අතර අළුතින් රැකියා විරහිතව සිටි විශාල කාන්තා පිරිසක් ඔවුන්ගේ ස්වයං රැකියාව ලෙස බිම්මල් ව්‍යාපාරය ආරම්භ කර ඔවුන්ගේ ගෘහස්ථ ආර්ථික හා සමාජ තත්වය ඉහල නංවාගෙන ඇත.

මෙම ව්‍යාපෘතිය මෙයින් නතර නොකර ඉදිරියේ Tissue Culture විද්‍යාගාරයක්දක්වා දියුණු කිරීමට අදාල ව්‍යාපෘති සැලසුම් සාදා ඇත.

## 2019 වර්ෂයේ ප්‍රගතිය

විකිණූ පැකට් ප්‍රමාණය - 2265

ලැබූ ආදායම - රු. 198,210.00

වියදම - රු. 156,406.00

ශුද්ධ ලාභය - රු. 41,804.00

බිම්මල් ප්‍රතිලාභීන් සංඛ්‍යාව - 54

නිෂ්පාදනය කරන බිම්මල් බීජ වර්ග - Normal Oyster, Butan Oyster, Abalony

බීජ පැකට් වල මිල
- Normal Oyster පැකට් 01 - රු . 80.00
- Butan Oyster පැකට් 01 - රු . 80.00 විදාතා බිම්මල් සංසදයේ සාමාජිකයින් සඳහා
- Abalony පැකට් 01 - රු . 90.00

සංසදයේ සාමාජිකත්වය නොගත් පිටතින් පැමිණෙන වෙනත් අය සඳහා

Normal Oyster පැකට 01 - රු . 100.00

Butan Oyster පැකට 01 - රු . 100.00

Abalony පැකට 01 - රු . 120.00


ඡායාරූප කිහිපයක් - 2018 වර්ෂය















ඡායාරූප කිහිපයක් - 2019 වර්ෂය





